



# මෙල්බන් තරුණ සවියෙන් කලා උළෙල 2006

**ශ්‍රී ලාංකික තරුණ පෙළ අතර අපේ සංස්කෘතිය පිළිබඳ ඇල්මක් ඇති කිරීම අපේ අරමුණක්**

**පැතුම් තිලකසිරි**

මෙල්බන් තරුණ පිරිසක් එක්ව සංවිදානය කෙරෙමින් පවතින කලා උළෙල 2006 සංස්කෘතික සන්දර්ශණය පිළිබඳ සාකච්ඡාවකට අප හා එක්වුණේ ශ්‍රී ටීවී ඔබ වෙත ගෙන එන තරුණ ගුවන්විදුලි ශිල්පි පැතුම් තිලකසිරි.
ඔහු අප හා කළ සංවාදයයි මේ.

*<u>මේ සඳහා දැනටමත් 100 කට ආසන්න පිරිසක් අප හා එක්ව සිටිනවා. ඒ අතර නර්තන කණ්ඩායම්, ගායක ගායිකාවන්, වාi ශිල්පීන්, නළු නිළියන්, බොහෝ දෙනෙක් ඉන්නවා. මෙල්බන් සරසවි වල ඉගෙනුම ලබන තරුණ තරුණියන් විශාල පිරිස-</u>*

***කලා උළෙල පිළිබඳ යම් හැඳින්වීමක් කරන්න පුලුවන්ද?***

කවදත් අපේ ශ්‍රී ලාංකික ප්‍රජාවට නැවුම් දෙයක් තිලිණ කරන ශ්‍රී ටීවී මාධ්‍ය කණ්ඩායමේ තවත් සාමූහික ප්‍රයත්නයක් තමයි කලා උළෙල 2006. අපේ ශ්‍රී ලාංකික සහෘදයනට අපේ සංස්කෘතික අංගයන් කීපයක් නැවත රස විඳින්නට අවස්තාව ලබා දීමත් අපේ දුවා දරුවනටත් තරුණ තරුණියන්ටත් හෙළ කලා අංග පිළිබඳ දැනුමක් ලබා දීමත් මෙයින් හැකියාව ලැබෙනවා. මෙහි නිර්මාණ දායකත්වය සියයිට සියයක්ම මෙල්බන් කලා ශිල්පීන් අතිනුයි සිදුවන්නෙ. නැටුම්, ගැයුම්, වැයුම්, රැඟුම්, අභිරූපන, නාට්‍ය ආදී නොයෙකුත් දෑ මෙම කලා උළෙල 2006 තුළදී දකින්න පුළුවන්. අපි දැනටමත් පුහුණුවීම් ආරම්භ කරලයි තියෙන්නෙ.

***මෙහි සංවිධාන කටයුතු කරන්න කවුද?***

මෙහි සංවිධාන කටයුතු සම්පූර්ණයෙන්ම සිදුකෙරෙන්නේ තරුණ පිරිසක් අතිනුයි. මෙල්බනයේ තරුණ කලා ශිල්පිණියන් දෙදෙනෙකු වන මෙලනි අබේසිංහ ත් ප්‍රසාධිනී විජේදාසත් මේ සඳහා මට සහය වෙනවා. ඔවුනට අමතරව රශ්මි, නිම්නා, ශෙවන්ති, අසංග වැනි අය මේ උළෙල වඩාත් උසස් තත්වයෙන් ඉදිරිපත් කරන්නට සහය වෙනවා. ඒ හැරෙන්නට අකරවිට සංඝානන්ද ස්වාමීන් වහන්සේ ගේ අවවාද අනුශාසනාත් අපේ විඩිහිටියන්ගේ උපදෙසුත් අපට ලැබෙනවා.


***පසුගිය වසරේ ඔබ සසල රූ සරණිය නමින් උළෙලක් ඉදිරිපත් කළා. එයත් මේ ප්‍රසංගයත් අතර ඇති වෙනස මොනවගේද?***

සසළ රූ සරණිය දැවැන්ත නිර්මාණයක්. එයට 175 ක පමණ පිරිසක් දායක වුණා. එහිදී අපි ඉදිරිපත් කළේ 1947 සිට අද දක්වා සිංහල සිනමාවේ විකාශය. මෙහිදී ලබා ගත් අත්දැකීම් මෙම කලා උළෙල සාර්ථක කරගැනීමට උපයෝගී කර ගත්තා. මේ කලා උළෙල එක මාතෘකාවක් ඔස්සේ දිගහැරෙන එකක් නෙවෙයි. ඔය ශ්‍රී ලංකාවේ කලා ක්ෂෙත්‍ර ගණනාවක් ආවරණය වන අයුරිනුයි ඉදිරිපත් වෙන්නෙ.

***ඔබ මෙහිදී තවත් විශේෂ කාර්යයක් කරන්නට සූදානම් වන බවක් අපට දැනගන්නට ලැබුණා.***

ඔව්. දැනට මෙල්බන් නගරයේ වෙසෙන වැඩිහිටි කලා ශිල්පීන් කීප දෙනෙකුට උපහාර පුදන්නට මෙම කලා උළෙලේ තරුණ පිරිස සූදානම්ව සිටිනවා. කැන්ගරු දේශයේ හෙළ කලාව පතුරවන්නට ඒ අය කළ සේවය අගය කිරීමක් ලෙසයි මේ කටයුත්ත සිදු කෙරෙන්නෙ.

***කලා උළෙලට දායක වන පිරිස හඳුන්වා දුන්නොත්...***



මේ සඳහා දැනටමත් 100 කට ආසන්න පිරිසක් අප හා එක්ව සිටිනවා. ඒ අතර නර්තන කණ්ඩායම්, ගායක ගායිකාවන්, වාi ශිල්පීන්, නළු නිළියන්, බොහෝ දෙනෙක් ඉන්නවා. මෙල්බන් සරසවි වල ඉගෙනුම ලබන තරුණ තරුණියන් විශාල පිරිසක් මෙයට දායක වී තිබෙනවා.

***මේ ප්‍රසංගය පැවැත්වෙන ස්ථානය..***

මේ කලා මංගල්‍යය පැවැත්වෙන්නෙ ඩැන්ඩිනොන් හි ඩ්‍රම් තියටර් හිදීයි. මෙය ඉතා අගනා, ආකර්ශණීය අලුත්ම කලා ගාරයක්. අනර්ඝ නිර්මාණයක් එයට සුදුසු අනර්ඝ තැනක පැවැත්විය යුතු යයි අපි හිතනවා.
ඒ එක්තකම මේ මොහොතේ අප හා අත්වැල් බැඳගත් ලක්හඬ මාධ්‍ය ආයතනයටත් සන්නස පුවත්පතටත් අපේ ස්තුතිය සෙනෙහසින් පුද කරන්නටත් මම කැමතියි. ■



# දයා සිල්වා
## හතළිස් වසරක සංගීත දිවිය සමරයි

දයා සිල්වා මෙල්බන් රසික ප්‍රසාදය දිනාගත් ගායකයන් අතරින් ඉදිරියෙන් සිටින ගායන ශිල්පියෙකි. මනා හැකියාවෙන් හා කුසලතාවෙන් පිරිපුන් සංගීත ශිල්පියෙකු වන දයා මේ ගෙවමින් සිටින්නේ සිය සංගීත දිවියේ 40 වන වසරයි. මේ සැමරුම වෙනුවෙන් දයා නිකුත් කළ ලක් සර ගී සංයුක්ත තැටිය දැන් ඔබට ලබා ගත හැකි ය.

සිංහල පොප් සංගීතයට විශේෂ උනන්දුවක් දැක්වූ දයා 1968 දී තරංගා නමින් සංගීත කණ්ඩායමක් ආරම්භ කළේ ය. දයා ගේ පළමු ගීත දෙක වන ආච්චි හා කුරුණෑගල 1969 දී පටිගත කරන ලද අතර ඒවා වටකට ගුවන් විදුලියේ කණ්ඩායම් ගී වැඩ සටහනින් ප්‍රචාරය විය. දයා 1976 දී ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය විය. ඔහු විසින් 1986 දී ආරම්භ කළ ඩිංකම් ලංකන් සංගීත කණ්ඩායම ඔස්ට්‍රේලියාවේ පළමු සිංහල සංගීත කණ්ඩායම විය. මේ සඳහා ඔහුට බන්දු දිසානායක, මිහිරි දිසානායක, තිලකා වෙල්ලාලගේ, අයිලීන් රණතුංග, චින්තා ගුණතිලක, රවි සිල්වා, ප්‍රියා සිල්වා යන අයගේ සහය ලැබුණි.

ක්ලැරන්ස් විජේවර්ධනගේ සමීප මිතුරෙකු වූ දයා 1989 දී ඔහුගේ සංගීත ප්‍රසංගයක් ඔස්ට්‍රේලියාවේ සංවිධානය කළේ ය. ඉන්පසු ඉන්ද්‍රාණී පෙරේරා, ඇනස්ලි මාලේවන, වැනි ගායක ගායිකාවන් රැසක් ඔස්ට්‍රේලියාවට ගේන්වීමට ඔහුට හැකි විය.

පිටරටකි වෙසෙන ලාංකිකයකු විසින් එළි දක්වන ලද ප්‍රථම ඩීවීඩී තැටිය එළි දැක්වීම දයාගේ සංගීත දිවියේ නොමැකෙන සටහනකි. වික්ටෝරියා ප්‍රාන්තයේ විවිධ දර්ශණීය ස්ථාන වල රූගත කළ මෙම ඩීවීඩී තැටියේ කැමරාකරණය මෙල්බන් හි දක්ෂ කැමරාශිල්පියෙකු වන ශ්‍රීලාල් කටුනායක අතින් සිදුවිය.

දයාගේ අලුත්ම සංයුක්ත තැටිය සඳහා මෙල්බන්හි වෙසෙ දක්ෂ ගායිකාවන් සිව් දෙනෙකු වන සෙව්වන්දිකා අබේරත්න, දිනෙල්කා දර්ශණී, වාසනා වීරකෝන් හා කාන්චනා පෙර්රා යුග ගායනයෙන් සහය වී ඇත.
සංගීතයෙන් තොර ජීවිතයක් මට නැහැ. දයා අපට පැවසුවේ ය.

# PROFESSOR DAVID M DE KRETSER
## A BIOGRAPHICAL NOTE OF VICTORIA'S NEW GOVERNOR

**BY PROFESSOR HENRY SATHANANTHAN.**

David de Kretser is Professor and the Foundation Director of the Institute of Reproduction & Development (from 1 Feb 05 known as the Monash Institute of Medical Research) at Monash University, Melbourne, Australia. He received his MBBS (1962) from the University of Melbourne and his MD (1969) from Monash University for a thesis entitled "Studies on the structure and function of the Human Testis". He is a Fellow of the Royal Australasian College of Physicians, a Fellow of the Australian Academy of Science and a Fellow of the Australian Academy of Technological Sciences and Engineering. He was admitted as an Officer in the Order of Australia in 2000 and was appointed a Sir John Monash Distinguished Professor in 2003.

His research in the field of reproductive biology, infertility, and endocrinology is internationally recognised and has resulted in over 600 papers in national and international peer reviewed journals and he is the Editor of a number of books. He has made important contributions to our knowledge of how sperm are formed in the testis and to the field of male infertility. Together with his graduate students and fellows, his laboratory has established the existence of paracrine (local) regulatory mechanisms in the testis. Over the past decade, he has co-directed a programme of research into the isolation and biology of the inhibin related proteins and has lead to numerous studies of the role of these proteins in reproductive biology and other systems. Current research interests also include investigations into genetic causes of male infertility, inflammation biology, and the biology of the family of proteins. His research has been supported continuously by grants from the National Health and Medical Research Council of Australia, World Health Organisation and the Ford Foundation, Biotechnology research grants and Industry. He has supervised over 30 Ph.D. students and 25 international postdoctoral fellows.

He serves on a number of editorial boards of international journals and has presented over 65 invited papers at international meetings